


# මුදල්, බැංකු හා මිල මට්ටම්

## (1 කොටස)

සැකසුම - ජී.ඒ.පී. මානෙල්
ශ්‍රී.ලං.වි.සේ. III
මිනු/බුරුල්ලපිටිය මහා විද්‍යාලය

# මුදල්

භාණ්ඩ හා සේවා හුවමාරු කිරීමේ දී ගෙවීම් මාධ්‍යයක් වශයෙන් පොදුවේ පිළිගන්නා වූ ඕනෑ ම දෙයක් මුදල් වශයෙන් සලකනු ලැබේ.

## හොඳ මුදලක ලක්ෂණ

- පොදු පිළිගැනීමක් තිබීම
- කල් පැවැත්ම
- සමජාතීය බව
- කුඩා ඒකකවලට බෙදිය හැකි වීම
- එහා මෙහා ගෙන යාමේ පහසුව
- නීත්‍යානුකූල වලංගුභාවය
- සුලබ හෝ දුර්ලභ නොවීම
- අනුකරණය කළ නොහැකි වීම
- පහසුවෙන් හඳුනාගත හැකිවීම

# මුදලේ ප්‍රධාන කාර්යයන්

- විනිමය මාධ්‍යයක් වශයෙන් කටයුතු කිරීම
- වටිනාකමේ සන්නිධියක් ලෙස කටයුතු කිරීම
- ගිණුම් ඒකකයක් ලෙස කටයුතු කිරීම
- විලම්බිත ගෙවුම් මාධ්‍යයක් කටයුතු කිරීම



# වර්තමානයේ භාවිත වන මුදල් වර්ග

- ව්‍යවහාර මුදල් - රටේ මූල්‍ය අධිකාරිය විසින් නිකුත් කරනු ලබන කාසි හා නෝට්ටු

- බැංකු මුදල් - ඉල්ලුම් තැන්පතුවල ඇති මුදල් ශේෂ

- ආසන්න මුදල් - වටිනාකමේ සන්නිධියක් ලෙස කටයුතු කරන නමුත් හුවමාරු මාධ්‍යයක් ලෙස ක්‍රියා නොකරන ඉහළ ද්‍රවශීලතාවයක් සහිත වත්කම් ය.
  නිදසුන් - ඉතුරුම් තැන්පතු, ස්ථාවර තැන්පතු




- මුදල් ආදේශක - තාවකාලික ව හුවමාරු මාධ්‍යයක් වශයෙන් කටයුතු කරන උපකරණයන් ය.
  නිදසුන් - ණයපත්, හරපත්

- විද්‍යුත් මුදල් - විද්‍යුත් ක්‍රමය භාවිතයෙන් ගබඩා කර තබා මෘදුකාංගයක් මගින් ගනුදෙනු සඳහා යොදා ගන්නා ක්‍රමවේදයන් ය.
  නිදසුන් - **E Banking, Easy Cash, Bit Coin**

# මුදල් ඉල්ලුම


කිසියම් අවස්ථාවක දී මුදල්, මුදල් වශයෙන් ළඟ තබා ගැනීමට මහජනතාව තුළ ඇත් කැමැත්ත මුදල් ඉල්ලුම හෙවත් ද්‍රවශීලතාවරණය ලෙස හැඳින්වේ.

## මුදල් ඉල්ලුම කෙරෙහි බලපාන හේතු

- **ගනුදෙනු චේතනාව**
- ආරක්ෂණ චේතනාව
- සමපේක්ෂණ චේතනාව

# ගනුදෙනු චේතනාව


- එදිනෙදා ගනුදෙනු කිරීමේ අරමුණෙන් මුදල් ශේෂ ළඟ තබා ගැනීම යි.
- ගනුදෙනු චේතනාවෙන් මුදලට ඇති ඉල්ලුම තීරණය කරන ප්‍රධාන සාධකය වන්නේ පුද්ගල ආදායමයි.
- ගනුදෙනු චේතනාවෙන් මුදලට ඇති ඉල්ලුමත් ආදායමත් අතර අනුලෝම සම්බන්ධතාවක් පවතී
- එය පහත පරිදි ප්‍රස්තාර සටහනකින් දැක්විය හැකිය.



# ආරක්ෂණ චේතනාව


- අනපේක්ෂිත ව ඇති වන වියදම් කාර්යක්ෂම ව පියවා ගැනීමේ අරමුණින් පුද්ගලයන් මුදල් ශේෂ ළඟ තබා ගැනීම යි.

- ආරක්ෂණ චේතනාව නිසා නිසා මුදලට ඇති ඉල්ලුමත් ආදායමත් අතර අනුලෝම සම්බන්ධතාවක් පවතින අතර එය පහත පරිදි ප්‍රස්තාර සටහනකින් දැක්විය හැකිය.



# සමපේක්ෂණ චේතනාව

- පිළිණපත්වල මුදල් ආයෝජනය කිරීමෙන් අනාගත වාසි ලබා ගැනීමේ අරමුණින් මුදල් ළඟ තබා ගැනීම සමපේක්ෂණ චේතනාවෙන් මුදලට ඇති ඉල්ලුමයි.
- සමපේක්ෂණ චේතනාවෙන් මුදලට ඇති ඉල්ලුම පොළී අනුපාතිකය අනුව තීරණය වේ.
- සමපේක්ෂණ චේතනාවෙන් මුදලට ඇති ඉල්ලුම හා පොළී අනුපාතිකය ඇති ප්‍රතිලෝම සම්බන්ධතාවය පහත පරිදි ප්‍රස්තාරයකින් දැක්විය හැකිය.



# පොලී අනුපාතය හා මුදල් ඉල්ලුම අතර සම්බන්ධතාව

පොලී අනුපාතය ↑

මුදල් සැපයුම ↓

පිළිණපත් ඉල්ලුම ↓

පිළිණපත්වල මිල ↓

එවිට වර්තමානයේ පිළිණපත් මිල දී ගැනීම වඩා ලාභදායක බැවින් මුදල් ශේෂ ළග තබා ගැනීමට ඇති ඉල්ලුම අඩු වේ

# මුදලට ඇති ඉල්ලුම තීරණය වීම කෙරෙහි බලපාන සාධක

- මූර්ත පොලී ආදායම
- පොලී අනුපාතිකය
- මිල මට්ටම
- අනාගත අපේක්ෂණ
- ආයතනික සාධක
- මූල්‍ය වෙළඳපොළ නව්‍යතා

# මුදල් සැපයුම

කිසියම් නිශ්චිත අවස්ථාවක දී මහජනතාව අතර සංසරණය වන මුළු මුදල් තොගය මුදල් සැපයුම ලෙස හැඳින්වේ.
විවිධ හේතු මත මුදල් සැපයුමට අදාළ නිර්වචනයන් කාලයත් සමග වෙනස් වී ඇත.
ශ්‍රී ලංකාවේ මුදල් සැපයුම පිළිබඳ ව ඉදිරිපත් කර ඇති නිර්වචනයන් පහත පරිදි වේ.

1. පටු මුදල් සැපයුම ($M_1$)
2. පුළුල් මුදල් සැපයුම ($M_2$)
3. ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම ($M_{2b}$)
4. පුළුල් මුදල් සැපයුම ($M_4$ )

- $M_1 = C_p + DD_p$
- $M_2 = M_1 + TSD_{cp}$
- $M_{2b} = M_2 + TSD_{NRFC} + RD_{FCBU}$
- $M_4 = M_{2b} + TSD_{LSB} + TSD_{RFC}$

$C_p$ - මහජනයා සතු ව්‍යවහාර මුදල්
$DD_p$ - මහජනයා සතු ඉල්ලුම් තැන්පතු
$TSD_{cp}$ - මහජනයා සතු වාණිජ බැංකුවල ඇති කාලීන හා ඉතුරුම් තැන්පතු
$TSD_{NRFC}$ - අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වල ඇති කාලීන හා ඉතුරුම් තැන්පතුවලින් 50% ක්
$RD_{FCBU}$ - විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකවල ඇති නේවාසිකයන් සතු කාලීන හා ඉතුරුම් තැන්පතු
$TSD_{LSB}$ - මහජනයා සතු බලපත්‍රලාභී විශේෂිත බැංකුවල ඇති කාලීන හා ඉතුරුම් තැන්පතු
$TSD_{RFC}$ - මහජනයා සතු බලපත්‍රලාභී මූල්‍ය සමාගම්වල ඇති කාලීන හා ඉතුරුම් තැන්පතු

# මුදල් සැපයුම තීරණය කරන සාධක

- බැංකු ක්‍රමය සතු ශුද්ධ දේශීය වත්කම්
- බැංකු ක්‍රමය සතු ශුද්ධ විදේශීය වත්කම්
- බැංකු ක්‍රමය සතු වෙනත් ශුද්ධ වත්කම්

# පදනම් මුදල්

- මහ බැංකුව විසින් නිකුත් කරන ලද කාසි හා නෝට්ටු වල වටිනාකම යි

- මෙය පහත සංරචක වලින් සමන්විත වේ

  - මහ ජනයා සතු ව්‍යවහාර මුදල්
  - වාණිජ  බැංකු සතු ව්‍යවහාර මුදල්
  - වාණිජ  බැංකු විසින් මහ බැංකුවෙ පවත්වා ගෙන යන තැන්පතු
  - රාජ්‍ය නියෝජිත ආයතන මහ බැංකුවෙ පවත්වා ගෙන යන තැන්පතු